# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 ජනවාරි මස 05 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.38 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**•පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ සහ බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සරත් සුමනසේකර
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
උදාර රත්නායක
උපාලි ගුණරත්න
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් පී. විතාන
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොයිස් විජිත
ලයනල් ජයසිංහ
ලලිත් එල්ලාවල
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදනය :

*"2016 මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2015.12.23 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. පළාත් සභාවේ කටයුතු :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2015.12.18 වන දින හා 2015.12.23 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව අද දින (2016.01.05) න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු රීති අංක 15(4), 63(අ)(2) හා 63(අ)(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය."*

## 04. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත :

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"මෙම පළාත් සභාව විසින්, "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත" සම්බන්ධව සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව එම අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දීමට ක්‍රියා කළ යුතු යැයි" මෙම පළාත් සභාව අදහස් කරයි.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 10.25 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.17 ට යළිත් රැස් විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : රණවිරු ගම්මාන වැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ රණවිරු ගම්මාන කිහිපයක්ම පිහිටුවා ඇති අතර, මෙම ගම්මානවල ජීවත් වන්නේ තිස් වසරක් අප රට තුළ පැවති යුද්ධයෙන් අප මව්බිම මුදා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාග කළ යුද්ධය නිසා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ මව්පියන්, අඹුදරුවන්ය.*

*මැතිවරණ කාලසීමාවන් තුළ දී සියලු දේශපාලන පක්ෂ නියෝජිතයින් රණවිරු ගම්මානවලට ගොස් ඡන්දය ලබා ගත්තද, එම ගම්මානවල වැසියන් ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන, පානීය ජලය නොමැතිකම වැනි ප්‍රශ්න රාශියකින් පීඩා විඳිති. අප රට වෙනුවෙන් විශාල කැපවීමක් සිදු කළ රණවිරු ගම්මානවල වෙසෙන ජනතාවගේ ඉහත සඳහන් අවශ්‍යතාවයන් ඇතුළු ගැටලු සොයා බලා ඒ සඳහා පිළියම් ලෙස රණවිරු ගම්මාන වැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයිද, එම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."*

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

***අ.භා. 12.45 පළාත් සභාවේ ගණ පූරණය නොමැති බව ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීම් සීනුව නාද කරන ලදුව පසුව ගණ පූරණය ඇති විය.***

***අ.භා. 12. 55 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

## 06. රීති අංක 30 යටතේ යෝජනාව :

රංජිත් සෝමවංශ - ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කළ යුතුය."*

***පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ,***
***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීම :

අනතුරුව, මූලාසනාරූඪ **[**සිරිකමල් පිලීෂියන් ද සිල්වා මහතා **]** ගරු මන්ත්‍රීතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.37 ට, 2016 ජනවාරි මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.01.05
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
අව/05
Minuts 2016.01.05 - Hansard Section